සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය | 2018 | 6 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | 2018 | தரம் 6 |
| **First Term Test** | 2018 | **Grade 6** |

| | |
|---|---|
| *නාට්‍ය හා රංග කලාව - I,II* | *පැය දෙකයි* |
| *Drama and Theatre - I,II* | *Two Hour* |

**නම/විභාග අංකය :- ..........................................................................................................**

- **නිවැරදි පිළිතුර යා කරන්න.**

01. "බඩගිනි වෙලා මා ගිය කළ පුතුගෙ ගෙට" කවිය සඳහන් වන්නේ,
02. කාලයගේ චරිතය සඳහන් වන්නේ
03. රජ කුමරියගේ චරිතය ඇතුළත් වන්නේ,
04. වෙද මුත්තාගේ චරිතය ඇතුළත් වන්නේ,
05. "අලියා හරියට ඉදලක් වගේ මෙම ප්‍රකාශය සඳහන් වන්නේ,

A "නාඩි බැලීම" ජන කතාවෙහි ය.
B අනුන්ට කැපූ වලෙහි තමන් වැටීම ජන කතාවෙහි ය.
C "බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට" ජන කතාවෙහි ය.
D අන්ධයෝ අලියාගේ හැටි කිව් ජන කතාවෙහි ය.
E හීල්බත් දංකුඩ ජන කතාවෙහි ය.

- **පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

06. ජනයා අතර ප්‍රචලිත කතන්දර ජන කතා වේ. ( )
07. චරිතයක් නිරූපණය කිරීමේදී සාත්වික අභිනය භාවිතා නොවේ. ( )
08. සංවාද කිරීමේදී පැහැදිලි ලෙස උච්ඡාරණය කළ යුතු ය. ( )
09. රංගනයේදී ආංගික අභිනය නළුවාට වැදගත් නොවේ. ( )
10. සෝමලතා සුබසිංහ ළමා නාට්‍ය නිෂ්පාදක වරියකි. ( )


11. කතන්දරයක් කියන විට නොකල යුත්තේ,
    1. පැහැදිලිව ඇසෙන ලෙස කීම.
    2. නිවැරදිව කීම.
    3. ගැඹුරු බසින් කීම.
    4. සිත් ඇද ගන්නා ලෙස කීම.
12. නාට්‍ය හා රංග කලාව ඉගෙනීමෙන් ඔබ තුළ ඇති වන යහපත් ගුණාංගයන් වන්නේ,
    1. සාමූහික බව ඇති වීම.
    2. අන්‍යයන්ට ගරු කිරීම.
    3. නිර්මාණශීලී බව ඇති වීම.
    4. ඉහත සියල්ල ම.
13. ස්වභාවික පරිසරයේ දැකිය හැකි සංසිද්ධියක් නොවන්නේ,
    1. හිරු නැග ඒම.
    2. මල් පිපීම.
    3. වැසි වැටීම.
    4. ගසක් කැපීම.
14. නාට්‍ය පෙළ හඳුන්වන තවත් නමකි,
    1. නාට්‍ය පිටපත
    2. නාට්‍ය සාරාංශය
    3. ඡායා පිටපත.
    4. නාට්‍ය පොත

15. සංවාදයක් ඉදිරිපත් කිරීමේදී කල යුතු දේ වන්නේ,

1. අවස්ථාවට උචිත පරිදි ඉදිරිපත් කිරීම.
2. රංග විධාන නොසලකා කීම.
3. තමන්ට පමණක් ඇසෙන ලෙස කීම.
4. වේගයෙන් ඉදිරිපත් කිරීම.

16. මෙම රූපයෙන් දැක්වෙන හැඟීම වන්නේ,

1. ප්‍රීතිය
2. බය
3. ශෝකය
4. කෝපය



• **පහත සඳහන් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

17. අලුතින් යමක් සිතා නිර්මාණය කිරීම ................................................ වේ.

18. එක් එක් චරිත තුළ විවිධ ....................................... ඇත.

19. පුහුණු වීමකින් තොරව සිදු කරන රංගනය ....................................... වේ.

20. ....................................... අධි මානුෂීය චරිතයකි.

**( භූමිකා , සුරංගනාවිය , පරිකල්පනය , ක්ෂණික නිරූපනය )**

## නාට්‍ය හා රංග කලාව - II

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

1) i ප්‍රස්ථාව පිරුළු ඇසුරින් නිර්මාණය වූ ජන කතාවක් ලියන්න. ( ලකුණු 08)

ii එම ජන කතාවෙන් ඔබට ලබා දෙන පණිවිඩය ලියන්න. (ලකුණු 02)

2) i භූමිකාවක් යනු කුමක්ද? (ලකුණු 02)

ii එක් චරිතයක් ලියා එම චරිතයේ දැකිය හැකි භූමිකා හතරක් ලියන්න. (ලකුණු 08)

3) i ඔබ දන්නා ජන කතා පහක් නම් කොට ඒවායින් ලබා ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

ii අනුකරණය කළ හැකි සත්ව චරිත පහක් ලියන්න. (ලකුණු 05)

04. i ස්වභාවික පරිසරයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න. (ලකුණු 10)